# 10 ශ්‍රේණිය
# ඉතිහාසය

## ක්‍රියාකාරකම් පත්‍රිකාවට අදාළ පිළිතුරු පත්‍රය

### ඒකකය 1
### ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය



## මූලාශ්‍රය වර්ගීකරණය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# මූලාශ්‍රය වර්ගීකරණය

- පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඉදිරියේ ඇති වරහන තුළ එහි අංකය ලියන්න.

01.පහත මූලාශ්‍රයන් අතුරෙන් සාහිත්‍ය මූලාශ්‍රය වර්ගයට අයත් මූලාශ්‍රය කුමක් ද?

1.දීප වංශ 2.තඹ මස්ස 3. පුවරු ලිපිය 4. ප්‍රතිමා ( 1 )

02.පැරණි සාහිත්‍ය මූලාශ්‍රය රචනා කිරීමේ දී බහුල ලෙස ප්‍රයෝජනයට ගෙන ඇත්තේ,

1. දැව ය 2.රන්පත් ය 3.පුස්කොළ පොත් ය 4.කඩදාසිය ( 3 )

03.පැරණි කාසි පිළිබඳ හදාරන විද්‍යාව කුමන නමින් හැඳින්වේ ද?

1. භෞතික විද්‍යාව 2. කාසි විද්‍යාව 3. නාණක විද්‍යාව 4. තාක්ෂණ විද්‍යාව

( 3 )

04.ඉතිහාසය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. අතීත මිනිසා විසින් අඳින ලද සිතුවම් ඉතිහාසයට අයත්වේ.

2.අතීත මිනිසා කළ කී සියලුම දෑ ඉතිහාසයට අයත් වේ.

3. අතීතයේ සිදු වූ සියලුම ස්වභාවික සිදුවීම් ඉතිහාසයට අයත් වේ.

4.ඉතිහාසය සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශ සියල්ල නිවැරදි වේ. ( 4 )

05. අභිලේඛනමය මූලාශ්‍රය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

1.පොත් පත් වල රචනා කර ඇති ලේඛන සියල්ල අභිලේඛන වලට අයත් වේ.

2.ගල් මත රචනා කර ඇති ලිපි සෙල්ලිපි ලෙස හැඳින්වේ.

3. පනාකඩුව තඹ සන්නස ඉතා වැදගත් අභිලේඛනයකි.

4. අභිලේඛන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගයට අයත් වේ. ( 1 )

- පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැනට හුදුසු වචනය වරහන් තුළින් තෝරා සම්පූර්ණ කරන්න.

01. ඉතිහාසය හැදෑරීමට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ඕනෑම දෙයක් ...මූලාශ්‍රය... ලෙස හැඳින් වේ. ( අභිලේඛන / මූලාශ්‍රය )

02. ඉතිහාසය හැදෑරීමේ දී ප්‍රයෝජනයට ගත හැකි පොත් පත් සියල්ල ...සාහිත්‍ය මූලාශ්‍රය... ලෙස හැඳින්විය හැකිය. ( විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය / සාහිත්‍ය මූලාශ්‍රය )

03. සීගිරි කැටපත් පවුරේ ඇති ...කුරුටු ගීත... අගනා අභිලේඛනමය මූලාශ්‍රය කි. ( සිතුවම් / කුරුටු ගීත )

04. ගලක් ගල් කණුවක් ලෙස සකස් කර රචනා කර ඇති ලිපි ...ටැම් ලිපි... ලෙස හැඳින්වේ. ( පුවරු ලිපි / ටැම් ලිපි )

05. පැරණි ජනයා ගේ ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දී ...සිතුවම්... වැදගත්වේ. ( සෙල් ලිපි / සිතුවම් )

- පහත සඳහන් සෙල් ලිපි කුමන සෙල් ලිපි වර්ගයට අයත්දැයි ලියන්න.



ලෙන් ලිපි



ගිරි ලිපි/පර්වත ලිපි



ආසන ලිපි



පුවරු ලිපි



ටැම් ලිපි

.................................... .......................................